මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

නිකුත් කළේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
දිනය 2022 අප්‍රේල් මස 08 වන දින

## මුදල් ප්‍රතිපත්ති විවරණය: අංක 03-2022 අප්‍රේල්

# ආර්ථිකය ස්ථාවර කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය සැලකිය යුතු ලෙස දැඩි කරයි

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය 2022 අප්‍රේල් මස 08 වැනි දින පැවති රැස්වීමේදී ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), 2022 අප්‍රේල් මස 08 වැනි දින ව්‍යාපාර කටයුතු අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි පදනම් අංක 700කින්, පිළිවෙළින්, සියයට 13.50 සහ සියයට 14.50 දක්වා ඉහළ නැංවීමට තීරණය කළේය. සමස්ත ඉල්ලුම ඉහළ යෑම, දේශීය සැපයුම් අංශයේ බාධා, විනිමය අනුපාතිකය අවප්‍රමාණය වීම සහ ගෝලීය වශයෙන් වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ඉදිරි කාලය තුළදී තවදුරටත් ඉහළ යා හැකි උද්ධමන පීඩන සලකා බලමින්, ආර්ථිකය තුළ පවතින ඉල්ලුම මත පදනම් වූ උද්ධමන පීඩන තවදුරටත් ගොඩනැගීම පාලනය කිරීම, අහිතකර උද්ධමන අපේක්ෂා වර්ධනය වීම වැළැක්වීම සහ විනිමය අනුපාතිකය ස්ථාවර කිරීම සඳහා අවශ්‍ය පෙළඹවීම සැපයීමට මෙන්ම, වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යුහයේ පැවති විෂමතා නිවැරදි කිරීම සඳහා සැලකිය යුතු ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග අත්‍යවශ්‍ය බව මුදල් මණ්ඩලයේ අදහස විය.

### විදේශීය අංශය දැඩි අභියෝගවලට අඛණ්ඩව මුහුණ දෙමින් පවතී

අඛණ්ඩව පසුගිය මාස කිහිපය තුළ එ.ජ. ඩොලර් බිලියනය ඉක්මවූ අපනයන ඉපැයීම් සමග අපනයන අංශයේ වර්ධනය අඛණ්ඩව පැවතිය ද ආනයන වියදම් ඉහළ මට්ටමක පැවතීම හේතුවෙන් වෙළඳ හිඟය අඛණ්ඩව පුළුල් විය. සංචාරක පැමිණීම්වල යහපත් ප්‍රගතියක් පෙන්නුම් කළ ද මෑත කාලීන භූදේශපාලනික අර්බුද මෙන්ම විදුලිය හා බලශක්ති බිඳවැටීම් සහ සැපයුම් අංශයේ බාධා සමග ඇති වූ දේශීය ආර්ථික අවිනිශ්චිතතා සංචාරක අංශය යථා තත්ත්වයට පත් වීම කෙරෙහි යම්තාක් දුරකට බලපානු ඇත. විනිමය අනුපාතිකයෙහි සිදු වූ වෙනස්වීම් සහ රැකියා සඳහා විදේශ ගතවීම් අඛණ්ඩව ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ යථා තත්ත්වයට පත් වීමේ සලකුණු පෙන්නුම් කරයි. විනිමය අනුපාතිකය නිර්ණය

වීමේදී වඩාත් වෙළඳපොළ මගින් තීරණය වීමට ඉඩ හැරීමත් සමග 2022 වසරේ මේ දක්වා කාලය තුළදී (2022 අප්‍රේල් 08 වන විට) එ.ජ. ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 33.0කින් අවප්‍රමාණය වීමක් වාර්තා විය. 2022 මාර්තු මස අවසානය වන විට දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ. ඩොලර් බිලියන 1.9ක් ලෙස තාවකාලිකව ඇස්තමේන්තු කර ඇත. කෙසේ වෙතත්, විදේශ විනිමය ගලා ඒමේ දුර්වලතා මධ්‍යයේ විනිමය අනුපාතිකය අධික ලෙස අවප්‍රමාණය වීම හේතුවෙන් ඇතැම් ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාව පෙන්නුම් කරයි.

## සැපයුම් අංශයේ සාධක සහ සමස්ත ඉල්ලුම් පීඩන වැඩි වීම හේතුවෙන් උද්ධමනය ඉහළ යමින් පවතී

සැපයුම් අංශයේ බාධා හේතුවෙන් මතුපිට උද්ධමනය අඛණ්ඩව ඉහළ ගිය අතර ආර්ථිකයේ පවතින යටිදැරි ඉල්ලුම් පීඩන වැඩි වීම මූලික උද්ධමනයේ අඛණ්ඩ ඉහළ යෑම මගින් පිළිඹිබු වේ. ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වීමත් සමග මිල ගණන් කෙරෙහි ඇති විය හැකි බලපෑමට අමතරව ගෝලීය වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම සහ එමගින් දේශීය මිල කෙරෙහි වන සෘජු හා වක්‍ර බලපෑම් මගින් නුදුරු කාලයේදී උද්ධමන පීඩන අඛණ්ඩව පවතිනු ඇති බව පෙන්නුම් කරන අතර එමගින් මහ බැංකුවට තවදුරටත් පූර්වෝපායික  ක්‍රියාමාර්ග ගැනීමේ අවශ්‍යතාව දක්වයි.

## වෙළඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් ඉහළ යමින් පවතී

මේ දක්වා අනුගමනය කරන ලද දැඩි මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගවලට ප්‍රතිචාර වශයෙන් වෙළඳපොළ පොලී අනුපාතික ක්‍රමයෙන් ඉහළ යමින් පවතී. කෙසේ වෙතත්, තැන්පතු අනුපාතිකවල ඉහළ යෑම, සංසරණයේ පවතින අතිරික්ත මුදල් බැංකු පද්ධතියට තැන්පතු ලෙස ආකර්ෂණය කර ගැනීම සඳහා ප්‍රමාණවත් නොවේ. රජයේ ඉහළ ණය ගැනීමේ අවශ්‍යතා අනුව රජයේ සුරැකුම්පත් මත ඵලදා අනුපාතික ද අනෙකුත් වෙළඳපොළ පොලී අනුපාතිකවලට වඩා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර එමගින් වෙළඳපොළ පොලී අනුපාතික ව්‍යූහයේ විෂමතා ඇති විය. බැංකු පද්ධතියේ ශුද්ධ විදේශීය වත්කම් පහළ යෑම හේතුවෙන් පුළුල් මුදල් ($M_{2b}$) වර්ධනයේ අඩු වීමක් දක්නට ලැබුණ ද බැංකු පද්ධතියේ ශුද්ධ දේශීය වත්කම් සැලකිය යුතු ලෙස ඉහළ ගියේය.

## ගෝලීය මෙන්ම දේශීය වශයෙන් පවතින අහිතකර ප්‍රවණතා දේශීය ආර්ථිකයේ ක්‍රියාකාරීත්වයට අභියෝග එල්ල කර ඇත

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට කරන ලද දළ දේශීය නිෂ්පාදිතයේ ඇස්තමේන්තු අනුව ශ්‍රී ලංකා ආර්ථිකය 2021 වසරේ අවසාන කාර්තුවේදී වාර්ෂික ලක්ෂ්‍යමය වශයෙන් සියයට 1.8කින් වර්ධනය වී ඇත. ඒ අනුව, 2020 වසරේදී වාර්තා වූ සියයට

3.6ක සංකෝචනය වීමට සාපේක්ෂව ශ්‍රී ලංකා ආර්ථිකය යථා තත්ත්වයට පත් වී 2021 වසරේදී සියයට 3.7ක වර්ධනයක් වාර්තා කර ඇත. සැපයුම් දාම සඳහා වන බාධා සහ වෙළඳ භාණ්ඩ මිල ගණන් ඉහළ යෑම වැනි ගෝලීය වශයෙන් වන අහිතකර ප්‍රවණතා මෙන්ම දේශීය වශයෙන්, විශේෂයෙන් විදුලිබල හා බලශක්ති සැපයුම් බාධා සහ අනෙකුත් හිඟයන් වැනි මෑත කාලීන අහිතකර ප්‍රවණතා 2022 වසර සඳහා වූ වර්ධන අපේක්ෂා සඳහා බලපා ඇත.

## මුදල් සහ අනෙකුත් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග මගින් මුදල් තත්ත්වයන් තවදුරටත් දැඩි කිරීම අපේක්ෂා කෙරේ

බාහිර කම්පනවල දැඩි බව, ඉහළ යන උද්ධමන පීඩන සහ දේශීය ආර්ථිකයේ අඛණ්ඩව ඇතිවන අසමතුලිතතා සැලකිල්ලට ගනිමින්, සෑම අංශයකම ස්ථාවරත්වය ආරක්ෂා කිරීමට මෙන්ම ආර්ථික ගැටළුවලට පිළියම් යෙදීම සඳහා සමස්ත ආර්ථිකයට බලපෑමක් ඇති කෙරෙන අනෙකුත් ක්‍රියාමාර්ග ද ඇතුළත් පුළුල් ප්‍රතිපත්ති මාලාවක් අත්‍යවශ්‍ය බව මුදල් මණ්ඩලයේ අදහස විය. ඒ අනුව, පවතින සහ අපේක්ෂිත ගෝලීය මෙන්ම දේශීය සාර්ව ආර්ථික ප්‍රවණතා මනාව සලකා බැලීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය, 2022 අප්‍රේල් 08 වැනි දින පැවති රැස්වීමේදී, ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR), 2022 අප්‍රේල් මස 08 වැනි දින ව්‍යාපාර කටයුතු අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි පදනම් අංක 700කින්, පිළිවෙලින්, සියයට 13.50 සහ සියයට 14.50 දක්වා ඉහළ නැංවීමට තීරණය කළේය. ප්‍රතිපත්ති වෙනස්කිරීම් ඵලදායී ලෙස සම්ප්‍රේෂණය වීම සඳහා පහසුකම් සැලසීමට ණය කාඩ්පත්, පෙර ගිවිසගෙන ඇති තාවකාලික බැංකු අයිරා සහ උකස් පහසුකම් මත පනවා තිබූ උපරිම පොලී අනුපාතික සීමා ඉවත් කිරීමට ද මුදල් මණ්ඩලය තීරණය කළේය. එවැනි ප්‍රතිපත්ති සහ නියාමන ක්‍රියාමාර්ග කඩිනමින් සම්ප්‍රේෂණය වීමත් සමග, අරමුදල් පිරිවැය ඉහළ නැංවෙනු ඇති බවත් එමගින් මුදල් සහ ණය ප්‍රසාරණය අඩු වීම; සංසරණයේ පවතින අතිරික්ත මුදල් බැංකු පද්ධතිය වෙත නැවත ලබා ගැනීමට පෙළඹවීම; පොලී අනුපාතික විෂමතා ඉවත් කිරීම; විනිමය අනුපාතික මත පවතින පීඩන ලිහිල් කිරීම; සහ ආර්ථිකයේ ඉල්ලුම් පීඩන ඇති වීම අවම කරනු ඇති බවත් මුදල් මණ්ඩලය අපේක්ෂා කරයි. මූල්‍ය ආයතනවලට ඔවුන්ගේ මූල්‍ය උපකරණ සඳහා වන පොලී අනුපාතික, විශේෂයෙන් තැන්පත්කරුවන්හට ප්‍රතිලාභ ලබා දීම සඳහා තැන්පතු පොලී අනුපාතික ඉහළ නංවන ලෙස දන්වා සිටී. වත්මන් මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට අනුකූලව, මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් තොගය අඩු කිරීම සහ එමගින් පවතින ලිහිල් මුදල් තත්ත්වය තවදුරටත් අඩු කිරීම සඳහා දැනට ක්‍රියාත්මක වැඩපිළිවෙළ අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත.

වර්තමානයේ රට මුහුණදී ඇති සාර්ව ආර්ථික අභියෝග ජය ගැනීමට තිරසාර විසඳුමක් සම්පාදනය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය දැනටමත් ජාත්‍යන්තර මූල්‍ය

අරමුදල සමග සමීපව කටයුතු කිරීම ආරම්භ කර ඇත. තාවකාලික මූල්‍යන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්ව සමග දැනටමත් සාකච්ඡා ආරම්භ කර ඇත. මහ බැංකුව විසින් මෙතෙක් අනුගමනය කර ඇති ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග සහ රජය සහ මහ බැංකුව විසින් තවදුරටත් ගනු ලැබීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග මගින් ඉදිරියේදී ආර්ථිකයේ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය යළි ඇති කරන අතරම මිල ගණන් මෙන්ම විදේශීය, මුදල් සහ මූල්‍ය අංශවල ඉහළ ස්ථාවරත්වයක් ගොඩනැගෙනු ඇතැයි මුදල් මණ්ඩලය දැඩිව විශ්වාස කරයි.

**මුදල් ප්‍රතිපත්ති තීරණය: ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවූ අතර ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය නොවෙනස්ව පවතී**

| | |
|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) | සියයට 13.50 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) | සියයට 14.50 |
| බැංකු අනුපාතිකය (නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය සමග ස්වයංක්‍රීයව ගලපන ලද) | සියයට 17.50 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (SRR) | සියයට 4.00 |

**තොරතුරු සටහන:**

මීළඟ මුදල් ප්‍රතිපත්ති නිවේදනය 2022 මැයි මස 19 වැනි දින නිකුත් කිරීමට නියමිතය.

**ඇමුණුම 1**

## සංඛ්‍යා සටහන 01: මූර්ත ද.දේ.නි.යේ වර්ධනය (තාවකාලික)

| ආර්ථික කටයුතු | වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2020 | | | | | 2021 | | | | |
| | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික | පළමු කාර්තුව | දෙවන කාර්තුව | තෙවන කාර්තුව | සිව්වන කාර්තුව | වාර්ෂික |
| **කෘෂි කාර්මික** | -7.1 | -7.8 | 3.5 | 2.0 | **-2.2** | 4.1 | 9.8 | 0.8 | -4.9 | **2.0** |
| **කර්මාන්ත** | -8.0 | -23.0 | 0.5 | 1.5 | **-6.9** | 5.9 | 22.7 | -1.6 | -0.2 | **5.3** |
| **සේවා** | 2.9 | -13.0 | 2.0 | 1.7 | **-1.6** | 2.9 | 7.3 | -1.5 | 3.8 | **3.0** |
| **ද.දේ.නි** | **-1.9** | **-16.4** | **1.3** | **1.3** | **-3.6** | **4.2** | **12.4** | **-1.5** | **1.8** | **3.7** |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 02: උද්ධමනය

| මාසය | | අගෝ 21 | සැප් 21 | ඔක් 21 | නොවැ 21 | දෙසැ 21 | ජන 22 | පෙබ 22 | මාර්තු 22 |
|---|---|---|---|---|---|---|---|---|---|
| **මතුපිට උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)** | කො.පා.මි.ද. (2013=100) | 6.0 | 5.7 | 7.6 | 9.9 | 12.1 | 14.2 | 15.1 | 18.7 |
| | ජා.පා.මි.ද. (2013=100) | 6.7 | 6.2 | 8.3 | 11.1 | 14.0 | 16.8 | 17.5 | - |
| **මූලික උද්ධමනය (වාර්ෂික ලක්ෂ්‍යමය % වෙනස)** | කො.පා.මි.ද. (2013=100) | 4.1 | 5.0 | 6.3 | 7.0 | 8.3 | 9.9 | 10.9 | 13.0 |
| | ජා.පා.මි.ද. (2013=100) | 4.7 | 4.8 | 7.2 | 8.8 | 10.8 | 12.9 | 14.1 | - |

*මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*

## සංඛ්‍යා සටහන 03: මුදල් අංශයේ ප්‍රවණතා (තාවකාලික)

| දර්ශකය | ප්‍රමාණය (රුපියල් බිලියන) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | **ජූනි 21** | **ජූලි 21** | **අගෝ 21** | **සැප් 21** | **ඔක් 21** | **නොවැ 21** | **දෙසැ 21** | **ජන 22** | **පෙබ 22** |
| සංචිත මුදල් | 1,065 | 1,064 | 1,089 | 1,296 | 1,286 | 1,288 | 1,306 | 1,337 | 1,324 |
| පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) | 10,165 | 10,304 | 10,514 | 10,488 | 10,582 | 10,546 | 10,647 | 10,668 | 10,755 |
| ශුද්ධ විදේශීය වත්කම් | (481) | (699) | (701) | (722) | (837) | (906) | (982) | (1,216) | (1,275) |
| ශුද්ධ දේශීය වත්කම් | 10,646 | 11,003 | 11,215 | 11,210 | 11,418 | 11,452 | 11,629 | 11,883 | 12,030 |
| රජය වෙත ලබා දුන් ශුද්ධ ණය (අ) | 5,124 | 5,411 | 5,531 | 5,595 | 5,665 | 5,714 | 5,832 | 6,045 | 6,094 |
| රාජ්‍ය සංස්ථා/ රජය සතු වාණිජ ව්‍යාපාර සඳහා ලබා දුන් ණය | 1,132 | 1,141 | 1,137 | 1,123 | 1,194 | 1,185 | 1,188 | 1,192 | 1,238 |
| පෞද්ගලික අංශය වෙත ලබා දුන් ණය | 6,585 | 6,661 | 6,796 | 6,825 | 6,860 | 6,920 | 6,981 | 7,017 | 7,051 |
| පුළුල් මුදල් සැපයුම ($M_4$) | 12,402 | 12,563 | 12,790 | 12,742 | 12,873 | 12,862(අ) | 12,985 | 13,055 | - |

(අ) සංශෝධිත

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

## සංඛ්‍යා සටහන 04: පොලී අනුපාතික

| **පොලී අනුපාතික (%)** | **2021 ඔක් අවසානයට** | **2021 නොවැ අවසානයට** | **2021 දෙසැ අවසානයට** | **2022 ජන අවසානයට** | **2022 පෙබ අවසානයට** | **2022 මාර්තු අවසානයට** | **2022 අප්‍රේල් 08 දිනට** |
|---|---|---|---|---|---|---|---|
| **ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ප්‍රතිපත්ති පොලී අනුපාතික** | | | | | | | |
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය | 5.00 | 5.00 | 5.00 | 5.50 | 5.50 | 6.50 | 13.50(අ) |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය | 6.00 | 6.00 | 6.00 | 6.50 | 6.50 | 7.50 | 14.50(අ) |
| **බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR)** | 5.93 | 5.92 | 5.95 | 6.48 | 6.48 | 7.49 | 7.49 |
| **භාණ්ඩාගාර බිල්පත් එලදා අනුපාතික (ප්‍රාථමික වෙළඳපොළ)** | | | | | | | |
| දින 91 | 8.43 | 7.53 | 8.16 | 8.63 | 8.61 | 12.92 | 14.12 (ආ) |
| දින 182 | 8.16 | 8.02 | 8.33 | 8.55 | 8.53 | 12.25 | 15.36 (ආ) |
| දින 364 | 8.18 | 8.16 | 8.24 | 8.55 | 8.53 | 12.28 | 15.69 (ආ) |
| **ණය අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතිකය (AWPR) (සතිපතා) | 7.82 | 8.00 | 8.61 | 8.52 | 8.99 | 9.85 | 10.44 |
| බරිත සාමාන්‍ය ණය අනුපාතිකය (AWLR) | 9.49 | 9.79 | 9.87 | 10.12 | 10.13 | - | - |
| බරිත සාමාන්‍ය නව ණය අනුපාතිකය (AWNLR) | 8.78 | 9.18 | 9.48 | 9.76 | 10.07 | - | - |
| **තැන්පතු අනුපාතික** | | | | | | | |
| බරිත සාමාන්‍ය තැන්පතු අනුපාතිකය (AWDR) | 4.79 | 4.82 | 4.94 | 5.01 | 5.07 | 5.17 | - |
| බරිත සාමාන්‍ය ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWFDR) | 5.70 | 5.75 | 5.94 | 6.05 | 6.15 | 6.30 | - |
| බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (AWNDR) | 5.96 | 6.27 | 6.45 | 6.58 | 6.50 | - | - |
| බරිත සාමාන්‍ය නව ස්ථාවර තැන්පතු අනුපාතිකය (AWNFDR) | 6.19 | 6.52 | 6.67 | 6.79 | 6.75 | - | - |

(අ) 2022 අප්‍රේල් මස 08 වැනි දින ව්‍යාපාර කටයුතු අවසානයේ සිට බලපැවැත්වෙන පරිදි

*මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව*

(ආ) 2022 අප්‍රේල් මස 06 වැනි දින පැවති වෙන්දේසියේ එලදා අනුපාතිකය